*සැ. යු.* - 2021.09.17 වැනි දින අංක 2246 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,247 - 2021 සැප්තැම්බර් මස 24 වැනි සිකුරාදා - 2021.09.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1930 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1933 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1934 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1935 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 ඔක්තෝබර් මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ඔක්තෝබර් මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

සංශෝධනයයි

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - කොළඹ**

2022 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

මේ සම්බන්ධව 2021.08.27 වැනි දින අංක 2243 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය හා සම්බන්ධ වේ.

02. නිරෝධායන ඇඳිරි නීතිය බලපැවැත්වීම හේතුවෙන් ඉහත ගැසට් නිවේදනය ප්‍රකාරව 2021.09.14 දින රා තැබෑරුම් රේන්ද විකිණීම සිදු නොකළ බව දැනුම් දෙනු ලැබේ.

03. ඒ අනුව, අදාළ ටෙන්ඩර්පත් භාරගන්නා අවසන් වේලාව 2021.10.15 වැනි දින පෙ. ව. 10.30 සහ රා තැබෑරුම් රේන්ද විකුණන වේලාව එදිනම පෙ. ව. 10.45 බවත්, අනෙකුත් සියලුම කොන්දේසි ඉහත සඳහන් 2021.08.27 වැනි දින අංක 2243 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය ප්‍රකාරවත් වන බව දැනුම් දෙමි.

නාලක රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
කොළඹ.

2021 සැප්තැම්බර් ස 14 වැනි දින,
කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-176/1

---

සංශෝධනයයි

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බදුල්ල**

2022 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2021.08.23 වැන දින කැඳවනු ලැබූ රා තැබෑරුම් රේන්ද විකිණීම පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ පනවන ලද නිරෝධායන ඇඳිරි නීතිය හේතුවෙන් අවලංගු කරන ලද අතර, නැවත රා තැබෑරුම් රේන්දය විකිණීම

2022 ජනවාරි මස 01 වැනි දින සිට 2022 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව, 2021.09.21 වැනි දින පෙරවරු 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්ද ලබා ගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ආපසු ගෙවන රු. 5,000.00 ක් ගෙවා ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි ආකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියමකර ඇති මුදල් ගෙවා ලබාගත් ටෙන්ඩර් වටිනාකමින් 25% ක් ඉක්මවන වත්කම් සහතිකයක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමෙහි අංකය හා නම පැහැදිලිව

ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් බදුල්ල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුවන් සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර්පත් භාර ගනු නොලැබේ.

04. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 2021.10.21 වැනි දින පෙරවරු 10.30 ට සියලු ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකළ ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බදුල්ල ප්‍රාදේශීය ලේකම් සතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2021.11.23 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. තනි වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණූ දින පස්වරු 2.00 ට පෙර බදුල්ල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක මුදල් කොටසකට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැන ගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි වේ.

ඩී. එම්. එල්. එච්. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

2022 වර්ෂය සඳහා අනුමත කරන ලද රා තැබෑරුම පිළිබඳ විස්තර - බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
2022.01.01 වැනි දින සිට 2022.12.31 වැනි දින දක්වා

| *තැබෑරුමේ නම සහ ලිපිනය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රා. ලේ. කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|
| බදුල්ල අංක 01 රා තැබෑරුම | බදුල්ල | බදුල්ල මහ නගර සභා අංක 06 දරන කොට්ඨාසයේ හුණුකොටුව නමැති රජයේ ඉඩම | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 5,000 | 2021.10.21 පෙ.ව.10.30 නැවත විකුණන දිනය .- සාර්ථක ගැණුම්කරුවෙකු ඉදිරිපත් නොවුවහොත් 2021.11.23 වැනි දින පෙ. ව. 10.30 ට නැවත විකිණීම සිදු කෙරේ. |

09-193

සංශෝධනයයි

**ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2022 වර්ෂය

2021.08.25 දින කැඳවනු ලැබූ රා තැබෑරුම් රේන්ද විකිණීම පවතින කොවිඩ් වසංගතය තත්ත්වය හමුවේ පනවන ලද නිරෝධායන ඇඳිරි නීතිය හේතුවෙන් අවලංගු කරන ලද අතර 2022 වර්ෂය සඳහා නැවත රා තැබෑරුම් රේන්දය විකිණීම

2022 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට 2022 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව 2021.10.26 වැනි දින පෙ.ව. 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්දය ලබාගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් වත්කම් සහතිකයක් ද, සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා වම් පස ඉහළ කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන රා තැබෑරුමේ අංකය හා නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාවට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් ලුණුගල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන්නට සැළැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරන ලද සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුවන් සම්පූර්ණ අත්සන් යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

04. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 2021.10.26 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකළ ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ලුණුගල ප්‍රාදේශීය ලේකම් සතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2021.11.02 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. තනි වරප්‍රසාද මිලදීගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකිණූ දින ප.ව. 2.00 ට පෙර ලුණුගල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක මුදල් කොටසට වැඩි කොටසක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි වේ.

ඩී. එම්. එන්. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගල.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

**2022 වර්ෂය සඳහා අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තුව**

***ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - 2022.01.01 වැනි දින සිට 2022.12.31 වැනි දින දක්වා***

| *අනුක්‍රමික අංකය* | *තැබෑරුමේ නම සහ අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම් පිහිටුවිය යුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කළ යුතු වේලාව* | *තැබෑරුම වැසිය යුතු වේලාව* | *ටෙන්ඩර් තැන්පත්* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය සහ වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01 | ලුණුගල අංක 02 | ලුණුගල | ලුණුගල ප්‍රාදේශීය සභාවේ කොට්ඨාස අංක 02 හි වරිපනම් අංක 219 දරන කුරුවි කුඹුරු වත්ත | පෙ.ව. 11.00ට<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | රුපියල් 5,000 | 2021.10.26 පෙ.ව. 10.30 |

මහදෝව වත්තේ සීමාව තුළ 2022 වර්ෂය සඳහා රා කැන්ටින් බලපත්‍රය අලුත් කිරීමට එම වත්තේ වතු අධිකාරි විසින් ඔහුගේ නිර්දේශය 2021.10.26 වැනි දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලුණුගල ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතු ය.

09-194

---

# රජයේ නොවන දැන්වීම්

**සන්ෂයින් හෙල්ත්කෙයා ලංකා ලිමිටඩ් සමාගම හා අක්බාර් ෆාමසියුටිකල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ඒකාබද්ධ කිරීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 242 (3)(ආ) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ කිරීමේ නිවේදනයයි

සන්ෂයින් හෙල්ත්කෙයා ලංකා ලිමිටඩ් සමාගම (සමාගම් අංක PB 335) හා අක්බාර් ෆාමසියුටිකල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (සමාගම් අංක PV 11321) යන සමාගම්හි අධ්‍යක්ෂ මණ්ඩල විසින් 2007 අංක 7 දරන සමාගම් පනතේ 242 (1) වගන්තිය ප්‍රකාරව සන්ෂයින් හෙල්ත්කෙයා ලංකා ලිමිටඩ් සමාගම හා අක්බාර් ෆාමසියුටිකල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම එක් අස්ථිත්වයක් බවට ඒකාබද්ධ කරනු ඇති බවත් මින් ඉදිරියට සන්ෂයින් හෙල්ත්කෙයා ලංකා ලිමිටඩ් සමාගම ලෙස පවත්වාගෙන යන බවටත් යෝජනා සම්මත කර ඇත.

මෙම ඒකාබද්ධ කිරීම සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ඒකාබද්ධ කිරීමේ සහතිකය නිකුත් කළ දින සිට බලාත්මක වනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සන්ෂයින් හෙල්ත්කෙයා ලංකා ලිමිටඩ්
සමාගමේ ලේකම්වරුන්.

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අක්බාර් ෆාමසියුටිකල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලේකම්වරුන්.

09-142

**ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 8 වන වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව හැන්සල් ටෙක්ස්ටයිල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් එහි නාමය ෆෲඩන්බර්ග් ඇපරල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙස 2021 අගෝස්තු මස 10 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වෙනස් කළ බවට ඉහත කී පනතේ 9 (2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙයින් දැනුම් දෙන වගයි.

සමාගමේ පෙර නාමය : හැන්සල් ටෙක්ස්ටයිල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 18003
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : 208 ඒ/2, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ
සමාගමේ නව නාමය : ෆෲඩන්බර්ග් ඇපරල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

මැනේජර්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,
ෆෲඩන්බර්ග් ඇපරල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.

09-162

---

**ඇටර්නි බලකරය අවලංගු කිරීම**

මොරටුව, කටුබැද්ද, පී. බී. අල්විස් මාවත, තිස්ස පෙදෙස, අංක 20/1 හි පදිංචි මොනිකා ශ්‍රියානි පෙරේරා වන මම පානදුර ප්‍රසිද්ධ නොතාරිස් හර්ශණ කණිෂ්ක රණසිංහ මහතා විසින් ලියා සහතික කළ අංක 28 හා වර්ෂ 2019 දෙසැම්බර් මස 25 දිනැති ඇටර්නි බලකරය මගින් මාගේ ඇටර්නි බලකරු වශයෙන් කෝට්ටේ, ඇතුල් කෝට්ටේ, කෝට්ටේ පාර, අංක 622/4 පදිංචි මයිකල් ෂෙල්ටන් පෙරේරා යන අය පත් කළ අතර, අද පටන් එය අවලංගු කර ඇති බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මොනිකා ශ්‍රියානි පෙරේරා.

09-175

---

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

සංශෝධනයයි

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - කොළඹ**

2022 වර්ෂය සඳහා රටබීම තැබෑරුම් රේන්ද විකිණීම

මේ සම්බන්ධව 2021.08.27 වැනි දින අංක 2243 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය හා සම්බන්ධ වේ.

02. නිරෝධායන ඇඳිරි නීතිය බලපැවැත්වීම හේතුවෙන් ඉහත ගැසට් නිවේදනය ප්‍රකාරව 2021.09.14 දින රටබීම තැබෑරුම් රේන්ද විකිණීම සිදු නොකළ බව දැනුම් දෙනු ලැබේ.

03. ඒ අනුව, අදාළ ටෙන්ඩර්පත් භාරගන්නා අවසන් වේලාව 2021.10.15 දින පෙ. ව. 10.30 සහ රටබීම තැබෑරුම් රේන්ද විකුණන වේලාව එදිනම පෙ. ව. 11.15 බවත්, අනෙකුත් සියළුම කොන්දේසි ඉහත සඳහන් 2021.08.27 දින අංක 2243 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය ප්‍රකාරවත් වන බව දැනුම් දෙමි.

නාලක රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
කොළඹ.

2021 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-176/2

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - නුගේගොඩ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

මෙම දේපළ නුගේගොඩ සිය ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති ලියාපදිංචි අංක පීවී 3948 දරන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන (කලින් ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 20493 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ) මෙසස් ඕවින් ගැසස් ප්‍රයිවට් ලිමිටඩ් සහ නුගේගොඩ පදිංචි සුමිත් නිමලසිරි විජේසිංහ ඒකනායක යන අය බන්ධනදයි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*1 වන වෙන්දේසිය :*

වයඹ පළාතේ, හලාවත දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ, මුන්නේශ්වරම් පත්තුවේ, මාදම්පේ දෙමටපිටිය සහ කීණගස්විල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. එම්. පෙරේරා විසින් සාදන ලද 1959.04.27 දිනැති අංක 5533 දරන සැලැස්මේ නිරූපනය වන කීණගස්වල එස්ටේට් නමැති ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් ඒ ලකුණු කළ සම්පූර්ණ ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර තිහක් (අ. 30, රූ. 0, පර්. 0) විශාල ඉඩම.

ඉහත සඳහන් දේපල 2021 ඔක්තෝබර් මස 28 වැනි දින පෙරවරු 10.00 ට සෙලාන් බැංකුව පීඑල්සී නුගේගොඩ ශාඛා පරිශ්‍රයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - හලාවත සිට කොළඹ පාර ඔස්සේ ගොස් 46 වන සැතපුම් කණුව දක්වා පැමිණි විට ඇති කාක්කපල්ලිය මංසන්ධියෙන් වම්පසට ඇති මැදගම පාරට හැරෙන්න. එම මාර්ගයේ ඉදිරියට ගිය විට ඇති 4 වන කි. මී. කණුව ද පසුකර තවත් මීටර් 50 ක පමණ දුරක් ගිය විට මාර්ගයේ වම්පස අදළ දේපළ පිහිටා ඇත.

*2 වන වෙන්දේසිය.* - බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, කෝට්ටේ නගර සභා සීමාව තුළ කලින් නුගේගොඩ දුම්රියපල පාර නමැති ස්ටැන්ලි තිලකරත්න මාවත යාව පිහිටි බලයලත් මිනින්දෝරු පී. එල්. බී. නානායක්කාර විසින් සාදන ලද 1979.09.02 දිනැති අංක 1507 දරන සැලැස්මේ නිරූපනය වන කොත්තනුවේ කුඹුර නැමැති ගොඩනැගිලි, ගස්, වගා බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 4 ඒ 1 ලකුණු කළ බෙද වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කොටස එකී අංක 1507 දරන සැලැස්ම අනුව පර්චස් විසිතුනක් (අ. 0, රූ. 0, පර්. 23) විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2021 ඔක්තෝබර් මස 28 වැනි දින පෙරවරු 10.30 ට සෙලාන් බැංකුව පීඑල්සී නුගේගොඩ ශාඛා පරිශ්‍රයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.*- නුගේගොඩ විදුලි සංඥා පුවරුව අසල සිට ස්ටැන්ලි තිලකරත්න මාවත ඔස්සේ මීටර් 300 ක පමණ දුරක් ගිය විට වරිපනම් අංක 221 දරන අදල දේපළ ස්ටැන්ලි තිලකරත්න මාවතේ පාරේ වම්පසින් පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - රජයේ ගැසට් පත්‍රයේ 2014.04.04 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2014.04.07 දින ද තිනකුරල් පුවත්පතේ 2014.04.04 දින පළ වී ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද කෝවිඩ් - 19 උපදෙස්වලට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,500, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් අතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරි (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011- 2456479, 2456481.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක 011-3068185, 011- 2572940.

09-91

### මහජන බැංකුව - බදුල්ල (මුතියංගන) ශාඛාව

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 වන (ඈ) වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේපත්තුව, දෙහිවල - ගල්කිස්ස මහනගර සභා සීමාව තුළ වෝඩ් 2 හි කළුබෝවිල, දුටුගැමුණු පාරේ පිහිටි වරිපනම් අංක 190/3 දරන ''කහටගහලන්ද'' නොහොත් කහටගහවත්ත, තුන්හවුල් කුරුදුවත්ත හා හෙදවකගහවත්ත'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට, බලයලත් මිනින්දෝරු එච්. අනිල් පීරිස් විසින් වර්ෂ 1990 පෙබරවාරි මස 25 වැනි දින මැන සකස් කරන ලද අංක 1049 ඒ දරන පිඹුරු පත ප්‍රකාර කැබලි අංක බී 1 ඒ දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 13.75) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ඇතුළු සියලුම දේ ද වේ.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2021 ඔක්තෝබර් මස 30 වැනි දින පෙ. ව. 11.30 ට මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය නුගේගොඩ (කොළඹ පිටත) පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලවම පවත්වනු ලැබේ.

වැඩි විස්තර සඳහා .- 2013.01.11 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ද 2013.01.17 වැනි දින දිනමිණ, ඩේලි නිවුස් සහ තිනකරන් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - කොහුවල හන්දියේ සිට දුටුගැමුණු වීදිය දිගේ (කොළඹ හොරණ ප්‍රධාන පාර) පාමන්කඩ දෙසට මීටර් 200ක් පමණ යන්න. කොහුවල පොලිස් ස්ථානය පසු කරමින් පීටර් ඩී. පෙරේරා මාවතට වමට හැරී මීටර් 40ක් පමණ යන්න. එම පාරට මායිම්ව වම් අත පැත්තේ මෙම දේපළට සමීප වීමට පුළුවන්.

*ගෙවීමේ ක්‍රමය.* -

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% දේශීය විකුණුම් බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකයට අදල මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) මහජන බැංකුව, බදුල්ල ශාඛාව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, (බදුල්ල) අංක 24, ආර්. එච්. ගුණවර්ධන මාවත, බදුල්ල යන ලිපිනය වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක 055- 2222165, 2222342, 2223067, 2223068
ෆැක්ස් : 055 2222361

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු , සාම විනිසුරු (මුළු දිවයිනටම)

නො. 11/55,
බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංක 011- 2053286/072 3207533, 076 - 9217329.

09-171

---

### මහජන බැංකුව - මහියංගනය ශාඛාව

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 වන (ඈ) වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කන්ද පහල කෝරළේ, මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹගහපැලැස්ස ග්‍රාම නිලධාරි කොට්ඨාසය අඹගහපැලැස්ස ග්‍රාමයේ පිහිටා ඇත්තාවූ ද, ''අඹගහපැලැස්ස යාය'' යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ටී. බී. එස්. සංගරන්දෙනිය විසින් සාදන ලද 2004.04.11 දින අංක 3686 දරන පිඹුරේ ලොට් අංක 01 C දරන ඉඩම ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් විසිනවයක් වූ (අ. 1, රූ. 2, පර්. 29) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ඇතුළු සියලුම දේ ද වේ.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2021 ඔක්තෝබර් මස 23 වැනි දින පෙ. ව. 11.30 ට මහජන බැංකුව මහියංගනය ශාඛා පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලවම පවත්වනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2019.02.08 වැනි දින රජයේ *ගැසට්* පත්‍රයේ ද 2019.02.08 වැනි දින දිනමිණ, ඩේලි නිවුස් සහ තිනකරන් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - මහියංගනය නගරයේ සිට මහනුවර මාර්ගයේ පාලම පසු කළ විට වමට හමුවන රංදෙනිගල මාර්ගයේ කි. මී. 13 කණුව පසු කරන විට මාර්ගයට දකුණුපස මෙම අය පදිංචි නිවස, වී මෝල, වී ගබඩාව සහිත දේපළ පිහිටා ඇත. ප්‍රධාන මාර්ගයට මුහුණ ලා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* -

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% දේශීය විකුණුම් බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකයට අදල මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) මහජන බැංකුව, බදුල්ල ශාඛාව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, (බදුල්ල) අංක 24, ආර්. එච්. ගුණවර්ධන මාවත, බදුල්ල යන ලිපිනය වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක 055- 2222165, 2222342, 2223067, 2223068 ෆැක්ස් : 055 2222361

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු , සාම විනිසුරු (මුළු දිවයිනටම)

නො. 11/55,
බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංක 011- 2053286/072 3207533, 076 - 9217329.

09-172

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.